# චතාරික සමයේ දෙවන සතිය
# සිකුරාදා

## පළමුවන කියැවීම

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

උත්පත්ති 37: 3-4, 12-13, 17b-28

**"මෙන්න ස්වප්නකාරයා, අපි ඔහු මරා දමමු."**

ඉශ්රායෙල් තම දරුවන් සියල්ලන්ට ම වඩා ජෝසෙප්ට ප්‍රේම කළේය. මන්ද, ඔහු තම මහලු වියේ ලත් පුත්‍රයා බැවිනි. ඒ නිසා ඔහු ජෝසෙප්ට අත් ඇති විශේෂ දිග ඇඳුමක් සාදා දුනි. ඔවුන්ගේ පියා ඔවුන් සියල්ලන්ට ම වඩා ජෝසෙප්ට ප්‍රේම කරන බව දැක ඔහුගේ සහෝදරයෝ ඔහුට වෛර කළහ. එබැවින් ඔහු සමඟ මිත්‍ර ලීලාවෙන් කතා කිරීමට ඔවුන්ට නොහැකි විය. ඔහුගේ සහෝදරයෝ ද තම පියාගේ එළු බැටළු පට්ටි බලා ගනු පිණිස ෂෙකෙම් නම් පෙදෙසට ගියහ. එවිට ඉශ්රායෙල් ජෝසෙප්ට කතා කරමින් "නුඹේ සහෝදරයන් ෂෙකෙම්හි එළු බැටළු පට්ටි බලා ගන්නවා නොවේ ද? එන්න මම නුඹ ඔවුන් වෙත යවමි"යි කී විට ජෝසෙප් ද 'මම ලැස්තිය' කියා උත්තර දුනි. එවිට ජෝසෙප් තම සොහොයුරන් සොයා යන විට දෝතාන්හි දී ඔව්හු ඔහුට හමු වූහ.

ඔහුගේ සහෝදරයෝ ඔහු දුර සිට දුටු හැටියේ ම ඔවුන් වෙත එන්නටත් පෙර ඔහු මරා දැමීමට කුමන්ත්‍රණය කළහ. ඔව්හු එකිනෙකා අමතමින් "ඔය එන්නේ ස්වප්නකාරයා, දැන් ඉතින් වරෙල්ලා, අපි ඔහු මරා වළකට දමා 'මොකෙක් හරි නපුරු වන සතෙක් ඔහු කා දැමුවේ යයි කියමු. එවිට ඔහුගේ සිහිනවලට සිදුවන දේ බලමු"යි කතා කරගත්හ. රූබන් ඒ අසා

ඔවුන් අතින් ඔහු මුදා ගැනීමට බලමින් “අපි ඔහුගේ ජීවිතයට හානියක් නොකරමු”යි කීය. තවදුරටත් ඔහු ඔවුන්ට කතා කොට, “ලේ බිඳක් නොහලා, පාළු තැන්නේ ඇති මේ වළට අපි ඔහු විසිකර දමමු. ඔහුට නම් අත නොතබන්නැ”යි කීවේය. ඔහු මෙසේ කීවේ ඔවුන්ගෙන් ඔහු බේරාගෙන තම පියාට නැවත ඔහු මුදා දෙන පිණිස ය. ජෝසෙප් තම සොහොයුරන් වෙත පැමිණි විට ඔව්හු ඔහුගේ ඇඳුම, අත් ඇති දිග විශේෂ ඇඳුම ගලවා දමා ඔහු රැගෙන වළකට දැමූහ. ඒ වළ ද වතුර නැති හිස් එකක් විය.

ඉන්පසු ඔව්හු ආහාර අනුභව කිරීමට වාඩි වී හිස ඔසවා බලන්නාහු ගිලියද්හි සිට මිසරයට ගෙනයන පිණිස කුළුබඩු ද සුවඳ ද්‍රව්‍ය සහ දුම්මල ද ඔටුවන් පිට පටවාගෙන යන ඉශ්මායෙල්වරුන්ගේ තවලමක් දුටහ. එවිට ජුදා තම සොහොයුරන් අමතමින්, “අපේ සහෝදරයා මරා දමා ඔහුගේ ලේ සැඟවීමෙන් කුමන පලක් ද? එන්න අපි ඔහු පිට අත නොතබා ඉශ්මායෙල්වරුන්ට විකුණමු. ඇත්තටම ඔහු අපේම සහෝදරයා නොවේ ද? අපි එක පියෙකුගේ දරුවෝ නොවෙමු දැ”යි කීය. ඔහුගේ සහෝදරයෝ ද එකඟ වූහ. මිදියන් ජාතික වෙළෙඳුන් ඔවුන් අසලින් යන කල ඔව්හු ජෝසෙප් වළෙන් ගොඩට ගෙන ඉශ්මායෙල්වරුන්ට රිදී කාසි විස්සකට වික්කෝ ය. ඔව්හු ද ජෝසෙප් මිසරයට ගෙනා හ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 105 : 16 – 21

පිළිතුර: සමිඳාණන්ගේ පුදුම ක්‍රියා මෙනෙහි කරන්න.

ගීය:

සමිඳාණෝ දේශයට සාගතයක් පැමිණෙවූ සේක. කෑම හානියක් ඇති කරවූ සේක. එහෙත් එතුමාණෝ ඔවුන්ට පෙරටුව මිනිසෙකු යැවූ සේක. එනම් වහල්කමට විකුණන ලද ජෝසෙප් ය.

ඔහුගේ පාදවලට විලංගු දමන ලදි. ගෙල වටා යකට වළල්ලක් දමන ලදි. ඔහු කී අනාගත කීම ඉටුවන තුරු සමිඳුන්ගේ අතින් ඔහු පරීක්ෂා කරන ලදි.

එවිට මිසරයේ රජ ඔහු මුදා හරින්නට අණ කළේය. ජාතීන්ගේ පාලකයා ඔහු නිදහස් කළේය. රජතුමා රාජකාරිය ඔහුට භාර දුන්නේය. මුළු දේශයේ ආණ්ඩුකාරයා ලෙස ඔහු පත් කළේය.

## සාධුකාරය

“දෙවියන් වහන්සේ ලෝකයට කොතරම් ප්‍රේම කළ සේක් ද කීවොත් ස්වකීය ඒක ජාතක පුත්‍රයාණන් වුව ද ලොවට දෙවා වදාළ සේක. උන් වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනා ම ජීවනය ලබන්නා හ.”

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 21 : 33-43, 45-46

### *"මෙන්න උරුමක්කාරයා, මොහු මරා දමමු."*

ජේසුස් වහන්සේ නැවතත් කතා කොට මෙසේ වදාළ සේක. "මේ උපමාවත් අසන්න. එක් වතු හිමියෙක් මිදි වත්තක් වවා එය වටා වැට බැඳ, එහි මිදි යන්ත්‍රයකට වළක් කැණ මුර අට්ටාලයක් ඉදි කොට, එය ගොවීන්ට අඳේට දී පිටරට ගියේය. අස්වැන්න කාලය ළං වූ කල පලදාවෙන් තම කොටස ගන්න පිණිස ඔහු තම දාසයන් ගොවීන් වෙත යැවීය. එවිට ගොවීහු ඔහුගේ දාසයන් අල්ලා එකෙකුට තැළූහ. එකෙකු මැරූහ. තව එකෙකුට ගල් ගැසූහ. යළිත් ඔහු මුලින් යැවූ අයට වඩා දාසයන් වැඩි ගණනක් යැවීය. ඒ ගොවීහු ඔවුන්ටත් පෙරසේ ම කළහ. අන්තිමට ඔහු 'මාගේ පුතණුවන්ට ඔවුන් ගෞරව කරනු ඇතැ"යි කියා සිය පුත්‍රයා ඔවුන් වෙත යැවීය. එහෙත් ගොවීහු පුත්‍රයා දැක "මේ උරුමක්කාරයා ය. එන්න, ඔහු මරා දමා මොහුගේ උරුමය ගනිමු" යි ඔවුනොවුන් අතර කතා කොට ඔහු අල්ලා වත්තෙන් පිටතට දමා මැරූහ. එහෙයින් ස්වාමියා ආ කල ඒ ගොවීන්ට කුමක් කරනු ඇද්ද? ඔව්හු කතා කොට, "ඔහු ඒ නපුරු මිනිසුන් දරුණු ලෙස විනාශ කොට නියම කන්නයේ දී තමාගේ අස්වැන්න කොට දෙන වෙන ගොවීන්ට මිදි වත්ත භාරදෙනු ඇතැ"යි කීහ. ජේසුස් වහන්සේ ඔවුන් අමතා මෙසේ වදාළ සේක.

"ගෘහ ශිල්පීන් ඉවත ලූ ගලම, කොණේ ප්‍රධාන ගල වී ඇත. මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි. අපේ ඇස් හමුයෙහි එය විශ්මය ජනක ය."

යන්න ශුද්ධ ලියවිල්ලෙහි ඔබ කවරදාවත් කියවා නැද්ද? එබැවින් මම ඔබට කියමි. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ කෙරෙන් ඉවත් කොට එය නියම පල උපදවන ජාතියකට දෙනු ලබන්නේය."

නායක පූජකවරුන්, පරිසිවරුන්, උන්වහන්සේගේ උපමා අසා ඒවා එල්ල කළේ තමන්ට බව දැන, උන් වහන්සේ අල්ලා ගන්න තැත් කළහ. එහෙත් උන් වහන්සේ දිවැසිවරයෙකැ"යි ජනතාව සැලකූ හෙයින් ඔව්හු ඔවුන්ට බිය වූහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය.